**තංගල්ල නගර සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 11 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට තංගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී අයකර ගන්නා ලද විනෝද බදු රු. 135,200 ක් ආදායම් ගිණුමට බැර නොකර තැන්පතු ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | තැන්පත් කළ විනෝද බදු මුදලින් සභාවට අයවිය යුතු ආදායම අදාළ ආදායම් ගිණුමට මාරු කර ඉතිරි මුදල් නැවත ගෙවීමට කටයුතු කරමි |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී නඩු පැවරීම් මත ලැබිය යුතු ටෙන්ඩර් ආදායම රු. 50,655 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ආදායම ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**
**----------------------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 60,205 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන අතර, එම තොරතුරු විගණනයට ලබා දීමට කටයුතු කරමි |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කොන්ත්‍රාත්තු වලදී මු.රෙ. 702(3) අනුව කටයුතු කරමින් ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත යොමු කරමි |
| (ආ) | 1980 අංක 47 දරන ජාතික පරිසර පනත ප්‍රකාරව 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රය | වලංගු කාලය ඉක්මවා ගොස් තිබුණු පරිසර ආරක්ෂණ බලපත්‍ර 04 ක ගාස්තු අයකර බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කර්මාන්ත 03 ක් පරිසර බලපත්‍ර මේ වන විට ලබා ගෙන ඇති අතර අනෙක් කර්මාන්තය සඳහා බලපත්‍රය ලබා ගන්නා ලෙසට ලිඛිතව දැනුම් දී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම,රු.15,522,614 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,988,438 ක් විය .

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,200,000 | 6,968,445 | 6,817,032 | 1,355,210 | 3,100,000 | 3,075,996 | 3,426,540 | 394,406 |
| කුලී | 11,709,700 | 10,640,705 | 10,503,241 | 82,459 | 11,777,100 | 10,292,685 | 5,249,302 | 321,606 |
| බලපත්‍ර ගාස්තු | 1,153,000 | 891,252 | 891,252 | - | 1,249,000 | 816,672 | 815,642 | - |
| වෙනත් ආදායම් | 21,799,500 | 15,244,506 | 14,904,465 | 14,875,983 | 19,311,500 | 15,342,565 | 11,138,603 | 14,457,168 |
| | 40,862,200 | 33,744,908 | 33,115,990 | 16,313,652 | 35,437,600 | 29,527,918 | 20,630,087 | 15,173,180 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු. 15,173,180 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 33,744,908 ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු. 48,918,088 ක් වුවද, වර්ෂය තුළ රැස්කරන ලද ආදායම රු. 33,115,990 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 68 ක් විය | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | වර්ෂය අවසානයේ පැවති හිඟයෙන් වරිපනම් බදු, කුලී හා වෙනත් ආදායම් වලින් මේ වන විට රු. 1,382,045 ක් අයකර ගත් අතර, ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වරිපනම් හා බදු ආදායම රු. 394,406 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 6,968,445 ක් විය. මේ අනුව වර්ෂය තුළ අයවිය යුතු වරිපනම් හා බදු ආදායම රු. 7,362,851 ක් වුවද, රැස්කළ ආදායම රු. 6,817,032 ක් වීමෙන්, වරිපනම් හා බදු ආදායම රැස් කිරීමේ ප්‍රගතිය සියයට 93 ක මට්ටමක පැවතුණි. | වරිපනම් අය කිරීමේ ප්‍රගතිය වැඩි කරගත යුතුවේ. | වර්ෂය අවසානයේ පැවති හිඟයෙන් 2019 අප්‍රේල් 30 දින වන විට රු. 301,169 ක් අයකර ගෙන ඇති අතර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට ලැබිය යුතු වරිපනම් බදු රු. 1,355,210 ක් වූ අතර හිඟය අයකර ගැනීමට නගර සභා පනතේ 170 (අ (වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | 2019 අප්‍රේල් 30 දින වන විට හිඟයෙන් රු. 263,329 ක් අයකර ගත් අතර, ඉතිරිය අයකර ගැනීමේදී රු. 1,000 ට වැඩි හිඟ වරිපනම් බදු සඳහා අවසන් නිවේදන නිකුත් කරන ලදී |

**2.2.4 කුලී**

**----**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ------------------------------ |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත කුලී ආදායම රු. 11,709,700 ක් වූ අතර, බිල්කළ ආදායම රු. 10,640,705 ක් විය. වර්ෂය තුළ රැස්කළ ආදායම රු. 10,503,241 ක් වීම නිසා රැස්කළ ආදායම බිල්කළ ආදායමට වඩා රු. 137,464 කින් අඩු වී තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව සැකසිය යුතුවේ. | කඩ බදු සඳහා වූ නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමේ බලාපොරොත්තුව මත වර්ෂයේ ඇස්තමේන්තු සකස් කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මෙම විචලතාවයට හේතු විය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයත් කඩ කාමර 10 කින් හා ධීවර විවේකාගාරයෙන් පිළිවෙලින් රු. 73,359 ක් හා රු. 9,100 ක් වශයෙන් එකතුව රු. 82,459 ක කුලී අයකර ගැනීමට තිබුණි | හිඟ කුලී අයකර ගත යුතුවේ. | වර්ෂය අවසානයේ පැවති හිඟයෙන් මේ වන විට රු. 11,320 ක් අයකර ගෙන ඇති අතර, නොගෙවූ කඩ 03 ක සන්තකය පවරා ගැනීමට කටයුතු කරමි |

**2.2.5 මුද්දර ගාස්තු**

**--------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | -------------------------------------- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 14,731,227 වූ අතර, ඉන් වර්ෂ 02 ත් 05 ත් අතර ශේෂය රු. 7,731,227 ක් විය. | මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ මුදලින් මේ වන විට රු. 1,000,000 ක් ලැබී ඇති අතර, ඉතිරිය ගෙන්වා ගැනීමට ලිපි යොමු කරන ලදී |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------**

**3.1 කාර්ය සාධනය**

**--------------**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

**-----------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | -------------------------- |
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 25ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 01 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | දකුණු පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සකස් කළ පළාත් සභාව විසින් ස්ථිර කර ඇති දකුණු පළාතේ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කරන ලදී |

**(ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් එකතු වටිනාකම රු. 7,300,000 ක් වූ සංවර්ධන යෝජනා 10 ක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය ලේඛනයේ ඇතුළත් කර ඇති සංවර්ධන යෝජනා ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | ප්‍රාග්ධන සැලැස්මේ වූ කර්මාන්ත ඉටු කිරීමට සභාව ප්‍රමුඛතාවය නොදුන් අතර සභාව යෝජනා කර අනුමත කරන ලද වෙනත් කර්මාන්ත ඉටු කරන ලදී. |

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතුවේ. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරමි |
| (ii) | ව්‍යාපෘති භූමියට රැගෙන එන නැවත භාවිතයට ගත හැකි පොලිතින්, ප්ලාස්ටික, කඩදාසි, ටයර් සහ වීදුරු ආදිය වෙන්කර විවෘත භූමියේ සුළඟට හා වර්ෂාවට නිරාවරණය වන පරිදි ගොඩගසා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නොදිරන ද්‍රව්‍ය වෙන් කිරීමේ කටයුතු දැනට ගෘහස්ථ භූමිය තුළ සිදු කරන අතර, විවෘත භූමියේ රැස් කිරීම් දැනට සිදු නොකරයි. |
| (iii) | කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා භාවිතයට ගත නොහැකි විශාල කසළ ප්‍රමාණයක් විවෘත පරිසරයේ ගොඩගසා තිබුණි. | නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. | භාවිතයට ගත නොහැකි කොටස් විධිමත්ව වැසීමට කටයුතු කරමි |

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක | 2020 – 2023 වර්ෂයන්ට අදාළ සිව් අවුරුදු සැලැස්ම සකස් කිරීමේදී මේ සඳහා ප්‍රමුඛතාවය ලබා දී සැලසුම් සකස් කරමි |

| | |
|---|---|
| සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත තනතුරු වල පැවති පුරප්පාඩු 34 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 09 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් කටයුතු කරමි |
| (ආ) | නගර සභාවේ සේවකයින් 19 දෙනෙකු අනුමත රාජකාරි වලින් බැහැර වෙනත් රාජකාරි සඳහා යොදවා තිබුණි. | නිලධාරීන් අනුමත රාජකාරිවල යෙදවිය යුතුවේ. | නගර සභාවේ සුබ සාධන සේවාව ඉහළ නැංවීමේ අරමුණින් පෙර පාසල් සේවයට නිලධාරීන් අනුයුක්ත කළ අතර සභාවේ දේපල හා සම්පත් ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් මුරකරුවන් නොසිටි නිසා මේ සඳහා කණිෂ්ඨ නිලධාරීන් යොදවන ලදී. |
| (ඇ) | ඉකුත් වර්ෂ වලදී සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු උත්සව හා ආපදා ණය රු. 51,135 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය අය කර ගත යුතුවේ. | අයකර ගැනීමට නොහැකි මෙම ණය මුදල් කපා හැරීමේ අයදුම් පත්‍රය පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් විෂය භාර අමාත්‍යතුමා වෙත යොමු කරන ලදී |

### 3.3 වත්කම් කළමනාකරණය

#### 3.3.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දින වන විටත් සභාව භුක්ති විදින ඉඩම් හා ගොඩනැගිලි 14 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | වත්කම් වල අයිතිය පවරා ගත යුතුවේ. | සභාව සතු දේපල නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා තංගල්ල ප්‍රාදේශීය ලේකම් හරහා අදාළ කටයුතු සිදු කරමි |

**3.3.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර කිහිපයක සිට භාණ්ඩ සමීක්ෂණය මගින් ඌන භාණ්ඩ ලෙස හඳුනා ගෙන ඇති රු. 1,472,600 ක් වටිනාකමැති භාණ්ඩ අයිතම 08 ක් සම්බන්ධයෙන් වූ නිර්දේශ 2019 මාර්තු 11 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුවේ. | ඌන භාණ්ඩ සම්බන්ධයෙන් මේ වන විට අවශ්‍යය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදු කර ඇත. |

**3.4 ප්‍රසම්පාදනය**

**3.41. ප්‍රසම්පාදන සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුවේ. | 2019 වර්ෂයේදී නිවැරදි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරමි |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී රු. 549,155 ක් වටිනා ප්‍රාග්ධන වත්කම් සභාව මිලදී ගෙන තිබුණද එම වත්කම් ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි. | විස්තරාත්මකව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 6,769,679 ක් වූ අතර එය සියයට 23 සිට සියයට 51 ක් දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | බලපත්‍ර හා සේවා ආදායම් අපේක්ෂා කළ ආදායමට වඩා අඩු වී තිබුණි |

| | | | |
|---|---|---|---|
| (ආ) | වියදම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු .1,717,536 ක් වූ අතර එය සියයට 12 සිට සියයට 13 ක් දක්වා පරාසයක විය . | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය | උපකරණ සඳහා දරන වියදම් වැඩි වීමත් අපේක්ෂා නොකරන ලද අලුත්වැඩියාවන් සිදු කිරීම හා වරිපනම් සඳහා ලබා දෙන වට්ටම් වටිනාකම වැඩි වීම හේතු විය |
| (ඇ) | වියදම් විෂයයන් 06 ක හිතකර විචලනයන්ගේ එකතුව රු .28,047,289 ක් වූ අතර එය සියයට 09 සිට සියයට 100 ක් දක්වා පරාසයක විය . | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය | පෞද්ගලික පඩිනඩි වියදම් ඇස්තමේන්තු කිරීමේදී පුරප්පාඩු තනතුරු සඳහා ප්‍රතිපාදන ඇති කිරීම, ස්ථාන මාරු ලැබ ගිය නිලධාරීන් වෙනුවෙන් නිලධාරීන් නොපැමිණීම හා ප්‍රාග්ධන සැලැස්ම යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත කර්මාන්ත ක්‍රියාත්මක නොවීම මෙයට හේතු විය |